## විවිධ ප්‍රවේශ ඔස්සේ සාර්ව ආර්ථික සමතුලිතය විශ්ලේෂණය කිරීම.

1.)සාර්ව ආර්ථික සමතුලිතයට අදාළ වගුවක් පහත දැක්වේ.

| ආදායම (y) | බදු(T ) | වැය කළ හැකි ආදායම(yd ) | පෞද්ගලික පරිභෝජනය (c ) | ආයෝජනය (I) | රජයේමැදිහත් වීම (G) | අපනයන (x) | ආනයන (m) | සමස්ත වියදම(E) |
|---|---|---|---|---|---|---|---|---|
| 100 | | | | | | | | |
| 200 | | | | | | | | |
| 300 | | | | | | | | |
| 400 | | | | | | | | |
| 500 | | | | | | | | |
| 600 | | | | | | | | |
| 700 | | | | | | | | |
| 800 | | | | | | | | |

1.මෙම ආර්ථිකයෙහි බදු 20ක්ද,ආයෝජනය 30ක්ද,රජයේ වියදම 40ක්ද,අපනයන 50ක්ද,ආනයන 60ක්ද,ආන්තික පරිභෝජන නැඹියාව 0.8ක්ද නම් ඉහත වගුව සම්පූර්ණ කරන්න.

2.සමතුලිත ජාතික ආදායම සොයන්න.

2.)සරල ආර්ථිකයක් සඳහා සමාහාර පරිභෝජනයට සහ ආයෝජනයට අදාළ පහත සඳහන් තොරතුරු ඔබට සපයා ඇත.

- ස්වාධීන (පවතින ආදායමේ බලපෑමක් නොමැතිව තීරණය වන)පරිභෝජන වියදම = රුපියල් මිලියන 100කි.
- ආදායමෙහි වැඩිවන සෑම රුපියලකින්ම ශත 25ක් ඉතිරි කෙරේ.
- ආයෝජනය රුපියල් මිලියන 200කි.

1.ඉහත සඳහන් තොරතුරු උපයෝගී කර ගනිමින් පරිභෝජන සහ ඉතුරුම් ශ්‍රිත ගොඩ නගන්න.
2.මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න.
3.පරිභෝජන,ඉතුරුම් සහ ආයෝජන ශ්‍රිත රූප සටහනක් ඇඳ,සමතුලිත ජාතික ආදායම තීරණය වන ආකාරය පෙන්වන්න.